පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 12 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

## බෞද්ධ ශිෂ්ටාචාරය I

## පිළිතුරු

| | | | |
| --- | --- | --- | --- |
| (1) | 3 | (26) | 1 |
| (2) | 1 | (27) | 4 |
| (3) | 3 | (28) | 2 |
| (4) | 4 | (29) | 1 |
| (5) | 2 | (30) | 2 |
| (6) | 5 | (31) | 3 |
| (7) | 4 | (32) | 3 |
| (8) | 3 | (33) | 5 |
| (9) | 1 | (34) | 1 |
| (10) | 5 | (35) | 4 |
| (11) | 2 | (36) | 4 |
| (12) | 3 | (37) | 2 |
| (13) | 4 | (38) | 3 |
| (14) | 5 | (39) | 1 |
| (15) | 2 | (40) | 1 |
| (16) | 3 | (41) | 5 |
| (17) | 1 | (42) | 5 |
| (18) | 1 | (43) | 2 |
| (19) | 5 | (44) | 4 |
| (20) | 2 | (45) | 3 |
| (21) | 4 | (46) | 3 |
| (22) | 3 | (47) | 1 |
| (23) | 2 | (48) | 4 |
| (24) | 5 | (49) | 2 |
| (25) | 3 | (50) | 5 |

## පිළිතුරු 11 - පත්‍රය

1 (1) ඉගෙනීම, ඉගැන්වීම, යාග කිරීම, යාග කරවීම, දන් දීම, දන් පිළිගැනීම යන කාර්යවලින් 04ක්

(11)

- වර්ණ ධර්මයේ සම්භවය පිළිබඳව දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රය තුළ මැනවින් විග්‍රහ කොට ඇති බව.
- සමාජයේ අවශ්‍යතාවය මත මහජනයාගේ සම්මතයෙන් රජු තෝරා පත් කරගත් අතර, ඔහු ''මහා සම්මත රජු'' ලෙස ප්‍රකට වූ බව. (ජනං රංජතී'ති රාජා)
- කෙත්වතුවලට අධිපති වූ බැවින් ක්ෂත්‍රිය නම් වූ බව. (ඛෙත්තානං අධිපතී'ති ඛත්තියෝ)
- සදාචාර විරෝධී ක්‍රියා පිළිකුල්කොට, ලාමක අකුසල ධර්මයන් බැහැර කළ පිරිස බ්‍රාහ්මණයන් වූ බව (පාපකේ අකුසලේ ධම්මේ බාහෙන්තී'ති බෝ වාසෙට්ඨ බ්‍රාහ්මණා)
- මෙවුන්දම් සේවනය කරමින්, ගව පාලනය ආදී විවිධ කර්මාන්තවල නිරත වූ පිරිස වෛශයයන් ලෙස හැඳින් වූ බව. (මේථුන ධම්මං සමාදාය විස්සුතං කම්මන්තේ පයෝජෙන්තී'ති බෝ වාසෙට්ඨා වෙස්සා)
- සොර මැරකම්, වංචා දූෂණ ආදී අපරාධයන්හි නියුතු වූ සදාචාර විරෝධී පිරිස් ශුද්‍ර නමින් හැඳින් වූ බව.(ළුද්දාචාරා ඛුද්දාචාරා ති බෝ වාසෙටඨා සුද්දා) ඉහත කරුණු මූලික කරුණු ලෙස ඇතුලත්ව ඇත්නම් ලකුණු ප්‍රදානය කරන්න.

(111)

- තවුස් දම් රැකීම සඳහා වනගත වීම මෙම ආශ්‍රමයේදී සිදු වේ.
- දරු මුණුපුරන් ලැබීමෙන් පසු භාර්යාව සමඟ හෝ හුදකලාව වනගත වීම විය යුතු බව.
- කාමභෝගී ජීවිතයෙන් සම්පූර්ණයෙන් ඉවත් විය යුතු ය.
- වනයෙන් සොයා ගන්නා ලද පලවැල ආහාරයට ගනිමින් හෝ පිඬු සිඟා යාමෙන් යැපිය යුතු ය.
- හෝම ගින්න නොනිවා පවත්වාගෙන යා යුතු ය.
- ආගමික අංශයට නැඹුරුව ආත්මය මුදවා ගැනීමට ක්‍රියා කළ යුතු ය.

(1v)

- කිසිවෙකු විසින් නිර්මාණය නොකරන ලද නො උපදවන ලද පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ, ජීව යනුවෙන් නිත්‍ය පදාර්ථ හතක් පමණක් ඇතැයි මෙතුමා උගන්වා ඇති බව.
- එම කාය සතෙහි නසන්නෙකු, නසවන්නෙකු, ඝාතනය කරන්නෙකු, කරවන්නෙකු නැති බවත් තියුණු සැතකින් යමෙක් යමෙකුගේ හිස සිඳින්නේ නම් එයින් කිසිවෙකු විසින් කිසිවකු ඝාතනය නොකරන ලද බවත් හුදෙක් සප්තකාය අතරින් ආයුධයක් විවරයට වැදීම පමණක් සිදුවන බවත්, උගන්වන බැවින් කුසලාකුසල කර්ම විපාක නොපිළිගන්නා මොහුගේ ඉගැන්වීම ද අකිරියවාදී වන බව.
- සප්ත පදාර්ථය පිළිගනිමින් සත්වයාගේ පැවැත්ම ප්‍රතික්ෂේප කරන මොහුගේ ඉගැන්වීම එක් අතකින් භෞතිකවාදයක් ලෙස සැළකිය හැකි බව හා අනෙක් අතට මෙම සප්ත පදාර්ථයන්ට නිත්‍ය, අවිපරිණාමී, ස්ථිර පැවැත්මක් ආරෝපණය කර ඇති හෙයින් නිත්‍ය ආත්මයක් පිළිගැනීම ලෙසද හැඳින්විය හැකි බව.
- ඒ අනුව මොහු ශාස්වතවාදියෙකු ලෙස ද හැඳින්විය හැකි ය.
- බෞද්ධ ඉගැන්වීමට අනුව අවිපරිණාමීය නිත්‍ය කිසිම දෙයක් ස්ථිරව නොපවතින බව.
- ලෝකයේ සෑම දෙයක්ම හේතු ප්‍රත්‍ය සංකලනයෙන් හටගෙන ඇති බැවින් සප්ත පදාර්ථයන් ද එයට අයත් වන හෙයින් ඒවායේ ද ස්ථිර පැවැත්මක් නොමැති බව.

(බෞද්ධ ශිෂ්ටාචාරය, ගුරු මාර්ගෝපදේශය 12 වසර 12-13 පිටු)

(v)

<u>පූර්ණ කස්සපගේ ඉගැන්වීම පිළිබඳව බෞද්ධ විචාරය</u>

- මිනිසා විසින් සචේතනිකව සිදු කරනු ලබන හොඳ නරක ක්‍රියාවේ වගකීම පුද්ගලයාට නො පැවරෙන බැවින් මිනිසාට අවශ්‍ය ඕනෑම දුරාචාර ක්‍රියාවක යෙදීමට මෙමඟින් ඉඩ සැලසෙන බව.
- එහෙයින් සමාජය තුළ ආචාර ධර්ම අර්ථවත් කිරීමට නොහැකි වී සමස්ථ සමාජයම සදාචාරමය වශයෙන් මහත් පරිහානියට පත්වන බව.
- බුදු දහම කම්මවාදී, කිරියවාදී, විරියවාදී දහමක් බැවින් සචේතන ක්‍රියාවේ වගකීම කරන්නා විසින්ම දැරිය යුතු යැයි උගන්වන බව.

- පුනර්භවය හෙවත් සත්වයාගේ සාංසාරික ප්‍රවෘත්තිය පිළිගන්නා බුදු සමය කර්ම විපාක සිද්ධාන්තය අවධාරණය කරන බව. (බෞද්ධ ශිෂ්ටාචාරය, ගුරු මාර්ගෝපදේශය 12 වසර 09 පිටුව)

මක්ඛලී ගෝසාලගේ ඉගැන්වීම පිළිබඳව බෞද්ධ විචාරය

- මොහුගේ ඉගැන්වීම් මගින් කර්ම විපාක බැහැර කෙරෙන නිසා මක්ඛලී ගෝසාල ද අකිරියවාදියෙකු ලෙස හැඳින්විය හැකි බව.
- සත්වයාගේ කෙලෙසීම හා පිරිසිදු වීම හේතු ප්‍රත්‍ය රහිතව සිදු වේ යැයි මක්ඛලී ගෝසාල ප්‍රකාශ කළද බුදුරජාණන් වහන්සේ සංයුක්ත නිකායේ මහාලි සූත්‍රයේ දී සත්වයාගේ කෙලෙසීමට හා පිරිසිදුවීමට බලපාන කරුණු පැහැදිලිව දක්වා ඇති බව.
- අහේතු අප්‍රත්‍යවාදය හෙවත් අධිච්චසමුප්පන්නවාදය මෙන්ම සියලු ආකාරයේ නියතිවාදී ඉගැන්වීම් ප්‍රතික්ෂේප කරමින් ''ඉමස්මිං සති ඉදං හෝති ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති..........'' යනාදී පටිච්චසමුප්පාද සිද්ධාන්තය ඉදිරිපත් කරමින් ලෝකයේ සියල්ල හේතුප්‍රත්‍ය සහිතව, පටිච්චසමුප්පන්නව ඇති වන නැති වන අයුරු විද්‍යාත්මකව තහවුරු කොට ඇති බව. (බෞද්ධ ශිෂ්ටාචාරය, ගුරු මාර්ගෝපදේශය 10 වසර 11 පිටු)

අජිත කේසකම්බලිගේ ඉගැන්වීම පිළිබඳව බෞද්ධ විචාරය

- පුඤ්ඤ පාප, කුසල අකුසල ක්‍රියාවන්ගේ ඵලවිපාක ද ප්‍රතික්ෂේප කරන අජිතකේශකම්බලි ශාස්තෘවරයා මරණින් මතු සියල්ල අවසන් වේ ය යන උච්ඡේදවාදයක් ඉදිරිපත් කොට ඇති බව.
- ''ලෝක සමුදයං ඛෝ කච්චාන සම්මපඤ්ඤාය පස්සතෝ යා ලෝකේ නත්ථිතා සා න හෝති'' යනුවෙන් පටිච්චසමුප්පන්නව සත්වයාගේ ලෝකයේ හටගැනීම හා පැවැත්ම මනා වූ නුවණින් දකින්නාට නාස්තික දෘෂ්ටිය හෙවත් උච්ඡේද දෘෂ්ටිය ඇති නොවන බව.
- සත්වයාගේ පැවැත්ම මරණයෙන් අවසන් නොවන්නේ යැයි අවධාරණය කරන බුදු සමය පුනර්භවය පිළිගන්නා බව.
- දසවස්තුක මිථ්‍යාදෘෂ්ටිය වෙනුවට දස වස්තුක සම්මා දිට්ඨියක් මහා චත්තාරීස ආදී සූත්‍රයන්හි දක්වා ඇති බව.

(බෞද්ධ ශිෂ්ටාචාරය, ගුරු මාර්ගෝපදේශය 12 වසර 12 පිටුව)

පකුධ කච්චායනගේ ඉගැන්වීම පිළිබඳව බෞද්ධ විචාරය

- සප්ත පදාර්ථයක් ඉදිරිපත් කරන මෙම ශාස්තෘවරයා කුසලාකුසල කර්ම විපාක නොපිළිගන්නා මොහුගේ ඉගැන්වීම ද අකිරියවාදී වන බව.
- සප්ත පදාර්ථය පිළිගනිමින් සත්වයාගේ පැවැත්ම ප්‍රතික්ෂේප කරන මොහුගේ ඉගැන්වීම එක් අතකින් භෞතික වාදයක් ලෙස සැලකිය හැකි බව හා අනෙක් අතට මෙම සප්ත පදාර්ථයන්ට නිත්‍ය, අවිපරිණාමී, ස්ථිර පැවැත්මක් ආරෝපණය කර ඇති හෙයින් නිත්‍ය ආත්මයක් පිළිගැනීම ලෙස ද හැඳින්විය හැකි බව.
- ඒ අනුව මොහු ශාස්වතවාදියෙකු ලෙස ද හැඳින්විය හැකි බව.
- ලෝකයේ සෑම දෙයක්ම හේතුප්‍රත්‍ය සංකලනයෙන් හටගෙන ඇති බැවින් සප්ත පදාර්ථයන් ද එයට අයත් වන හෙයින් ඒවායේ ද ස්ථිර පැවැත්මක් නොමැති බව.

(බෞද්ධ ශිෂ්ටාචාරය, ගුරු මාර්ගෝපදේශය 12 වසර 13 පිටුව)

සංජය බෙල්ලට්ඨිපුත්තගේ ඉගැන්වීම පිළිබඳව බෞද්ධ විචාරය

- බ්‍රහ්මජාල සූත්‍රයට අනුව මොහුගේ ඉගැන්වීම අමරාවික්ඛේපවාදය ලෙස හැඳින්වෙන බව.
- අමරාවික්ඛේපවාදය සංසයවාදය ලෙස හැඳින්වෙන බව.
- සත්වයාගේ මරණින් මතු පැවැත්ම, පරලොව, කුසලාකුසල කර්මයන්ගේ ඵල විපාක ආදිය පිළිබඳ විමසන ලදුව නිශ්චිත පිළිතුරක් නොදීම සංජයගේ පිළිවෙත වී ඇති බව.
- මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු නොදීමේ හේතු හතරක් බුදු සමය පෙන්වා දී ඇති බව.

(බෞද්ධ ශිෂ්ටාචාරය, ගුරු මාර්ගෝපදේශය 12 වසර 13-14 පිටු)

නිගණ්ඨනාතපුත්තගේ ඉගැන්වීම පිළිබඳව බෞද්ධ විචාරය

- බුදුසමය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම සිද්ධාන්ත මගින් ආත්මීය නිත්‍ය අවිපරිණාමීය පදාර්ථවල පැවැත්ම බැහැර කරන බැවින් ජෛන නිත්‍ය ආත්මවාදය බිඳවැටෙන බව.
- චතුයාම සංවරය, පරම අවිහිංසාවාදය ආදී ජෛන ප්‍රතිපදාව ප්‍රායෝගික ජීවන දර්ශනයක් හෝ විමුක්ති මාර්ගයක් හෝ නොවන බව.
- බුදු සමය කර්ම විපාක සිද්ධාන්තය පිළිගත්ත ද පුබ්බේකතහේතුවාදය සපුරා ප්‍රතික්ෂේප කරන බව.

(බෞද්ධ ශිෂ්ටාචාරය, ගුරු මාර්ගෝපදේශය 12 වසර 14-15 පිටු)

2 (1) මගධය, කෝසලය, වත්සය, අවන්තිය

(11) මගධය

- උතුරින් ගංගා නදිය ද නැගෙනහිරින් චම්පා නදිය ද නිරිත දිගින් චම්පා කඳු වැටිය ද බටහිරින් සෝණ නදිය ද සීමා කොටගත් ප්‍රදේශය මගධ දේශයට අයත් වූ බව.
- අගනුවර රජගහනුවර විය. බිම්බිසාර හා අජාසත් රජකම් කළහ.
- වේභාර, වේපුල්, ගිජ්ඣකූට, ඉසිගිලිය, පාණ්ඩව යන පර්වත පහකින් වට වී පැවති නිසා ''ගිරිබ්බජ'' නම් වීය.
- ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණ බලතල රජු සතු වීය.
- රජතුමා නීති පැනවීම, නීති ක්‍රියාත්මක කිරීම හා දඬුවම් පැමිණවීය.

කෝසලය

- බටහිරින් පංචාල රට ද දකුණින් ගංගා නදිය ද නැගෙනහිරින් සදානීරා නදිය ද උතුරින් නේපාල කඳුකර පෙදෙස ද සීමා කොටගත් ප්‍රදේශය කෝසලයට අයත් වේ.
- මුල් අවධියේ දී දුර්වල රාජ්‍යයක්ව පැවති කෝසලය පසුකාලීනව වඩාත් ප්‍රබල වූ බව
- එය බරණැස හා සාකේත රාජ්‍යය ද ඇතුළත් විශාල ප්‍රදේශයක් පුරා පැතිර ගිය බව හා එහි අගනුවර සාවත්ථිය (සැවැත්නුවර) වූ බව.
- පසේ නදී කොසොල් රජතුමා එහි බුද්ධ කාලීන භාරතීය පාලකයා වූ බව.

වත්සය

- වත්ස ජනපදය අවන්ති රටට උතුරින් යමුනා නදී තීරයේ පිහිටා තිබූ බව.
- කෝසම්භිය හෙවත් කොසඹෑ නුවර එහි අගනගරය වූ බව.
- පරන්තප රජුගේ පුත් උදේන රජු එහි බුද්ධ කාලීන පාලකයා වූ බව.

අවන්තිය

- දඹදිව මධ්‍ය ප්‍රදේශයෙන් දකුණු දිසාවෙහි පිහිටි බුද්ධ කාලීන රාජ්‍යකි.
- බුද්ධ කාලීන පාලකයා වූයේ චණ්ඩපජ්ජෝත රජු ය.
- උදේනිය එහි අගනුවර වීය.
- උත්තර අවන්තිය හා දක්ෂිණ අවන්තිය වශයෙන් මෙය කොටස් දෙකකට බෙදී පැවතුනි.

(111)

- කාලයක් තිස්සේ පැවති භාණ්ඩ හුවමාරු ක්‍රමය ඇත් වී මුදල් භාවිතයට යොමු වීම, එනම් මස්ස, අඩමස්ස, අඩමස්ස කහවනු ආදී වශයෙන් මුදල් භාවිත කිරීමට ක්‍රමයෙන් යොමු වීම.
- භාරතීය දේශීය මාර්ග පද්ධතිය සංවර්ධනය වී, ජාත්‍යන්තර මාර්ග හා බද්ධ වීම, එනම් විදේශ වෙළඳාම ව්‍යාප්ත වීම හා පුළුල් වීම.
- සිටුවරු නමින් ධනපති පංතියක් බිහි වීම. එනම් මහා සෙට්ඨි, චුල්ල සෙට්ඨි, වශයෙන් මහ සිටුවරු, උප සිටුවරු වශයෙන් ධනවත් පිරිසක් බිහි වීම.
- වෙළඳ නගර බිහි වීම හා එම නගර මුල්කරගෙන දේශිය වශයෙන් හා විදේශීය වශයෙන් වෙළඳාම පුළුල්වීම.
- විනෝදාස්වාදය ගෙන දෙන උත්සව , සැණකෙළි, සංදර්ශන ආදිය බහුල වශයෙන් පැවැත්වීම බොහෝ පිරිස් ඒ සඳහා නගරයට ඇදී ඒම.
- සුරාසැල් ව්‍යාප්ත වීම, ගණිකාවන් වැඩි වීම සහ ඒ වෙනුවෙන් ධනවතුන් වඩ වඩාත් ඇදී යාම.
- මුදල් පොලී කිරීම, බැංකු ක්‍රමයක් ඇති වීම හා මුදල් ගනුදෙනු බහුල වීම.